ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

# **පුවත්පත් නිවේදනය**

## **ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර 7 වන වාර්ෂික ආරක්ෂක සංවාදය**

ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර 7 වන වාර්ෂික ආරක්ෂක සංවාදය 2023 පෙබරවාරි 23-25 දිනයන්වල නව දිල්ලියේ දී පැවැත්විණ. ආරක්ෂක ලේකම් ජෙනරාල් (විශ්‍රාමික) කමල් ගුණවර්ධන මහතා, ශ්‍රී ලංකා ගුවන් හමුදාපති එයාර් මාෂල් එස්. කේ. පතිරණ මහතා සහ ශ්‍රී ලංකා යුධ හමුදාවේ සහ නාවික හමුදාවේ ජ්‍යේෂ්ඨ නිලධාරීන්ගෙන් සැදුම්ලත් නියෝජිත පිරිසක් මේ සඳහා සහභාගී වූහ. මෙහිදී දැනට ක්‍රියාත්මක විවිධ ආරක්ෂක සහයෝගීතා වැඩසටහන් දෙපාර්ශවය විසින් සමාලෝචනය කෙරුණු අතර සබඳතා ශක්තිමත් කර ගත හැකි නව මාර්ග ද හඳුනා ගන්නා ලදී.

ආරක්ෂක ලේකම් කමල් ගුණරත්න මහතා නව දිල්ලියේ කීර්තිමත් ජාතික ආරක්ෂක විද්‍යාලයේ දේශනයක් සිදු කළේය. දෙරටෙහි ම ආරක්ෂක ලේකම්වරු මෙන්ම එයාර් මාෂල් එස්. කේ. පතිරණ මහතා ද ජාතික ආරක්ෂක විද්‍යාලයේ ආදි විද්‍යාර්ථයින් වේ. ශ්‍රී ලංකා නියෝජිත පිරිස 2023 පෙබරවාරි 24 වන දින තිරුපති දේවාලය ද වැඳපුදා ගත්තේය. එසේම, ඔවුහු මුම්බායි හි නාවික අංගනයේ ඉන්දියානු නාවික හමුදාවේ බටහිර නාවික විධානය භාර ප්‍රධාන අණදෙන නිලධාරිතුමා ද හමු වූහ.

වාර්ෂික ආරක්ෂක සංවාදය “කලාපයේ සැමට ආරක්ෂාව සහ වර්ධනය” (Security and Growth for All in the Region – SAGAR) සහතික කිරීම සඳහා කලාපීය ආරක්ෂක තත්වය, පොදු ආරක්ෂක අභියෝග සහ වඩා සමීප ආරක්ෂක සහයෝගීතාවයක් සඳහා මාර්ග යනාදිය පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා දෙරට අතර ප්‍රධානතම ආරක්ෂක සංවාදය වේ.

*****

කොළඹ

2023 පෙබරවාරි 25